

# අර්ය අරණ ධර්ම දේශනා 3

# ප්‍රියමනාප බව හා හානිදායක බව

**ඔතන විශේෂ කරුණක් තමයි සමහර දේවල් තියනවා ප්‍රිය මනාපයි. හානිදෘයකයි. ඒකත් තේරුම් ගන්න ඕන. ප්‍රිය මනාප භාවය එකක්. හානිය කියන්නේ වෙන එකක්. අපිට දැන් රුධිර පීඩනය තියෙන්න පුළුවන්. රුධීර පීඩනය තියෙන කෙනා ලුණු කන්න කැමතියි. හැබැයි දොස්තර කියනවා "ලුණු කෑවොත් ඔයාට පීඩනය වැඩි වෙනවා. නහරයක් පුපුරන්නත් පුළුවන් " කියලා දැන් කැමැත්ත එකක්. තමන්ට හිතකර දේ වෙන එකක්. එතකොට අන්න මේ හිතකර දේ ගැනයි මේ කියන්නේ. කැමැත්ත නෙවෙයි. සමහර විට දෙවැනි සත්ත්වයෙක් ආස දෙයක් ඉල්ලන්න පුළුවන් අපෙන්. නමුත් අපි කල්පනා කරන්න ඕන එයාට ඒක දෙන එකෙන් මම එයාට කරන්නේ හොඳක්ද? නරකක්ද? කියලා. ඔන්න ඔය විදියටයි උරගලා බලන්න ඕනෑ. දැන් සමහර විට කෙනෙක් ඇවිල්ලා අපෙන් අයිස්ක්‍රීම් එකක් ඉල්ලනවා. එතකොට අපි ළඟ අයිස්ක්‍රීම් තියෙනවා හැබැයි එයා දියවැඩියා රෝගීයෙක් නම් අපි එයාට කරන්නේ හානියක්. එහෙනම් නොදිය යුතුයි. ඒකයි වෙන්න ඕන. ඒ විදියටයි මේක තේරුම් ගන්න ඕන. ඕන්න අස්සාස 4 හරියට ම ක්‍රියාත්මක වෙන තැන. ඔන්න ඕක තේරුම් ගත්තා නම් ඕක තමයි පළවෙනි කරුණ බුදුහාමුදුරුවෝ පෙන්වන මේ අවුල ලිහා ගන්න තියෙන එක දෙයක්.**

කවුරු හරි මොනාහරි කිව්වාම ඔතෙන්ට ගලපලා බලනවා. කාට හරි චක්‍රයේ කොතැන හරි හිංසාවක් වෙනවාද? එහෙනම් ඒක අධර්මයක් ඔක්කෝටම සුව වෙනවා, හොදක් වෙනවා නම් අන්න ඒක දහමක් ඔන්න ඔය විදියට මේක සැලකිල්ලට ගන්න ඕන අපි පළවෙනි කරුණ.

දෙවැනි කරුණ. (මහා පරිනිබ්බාන සුත්‍රයේ "සතර මහා පදෙස" ඇසුරෙන්)

## ධර්මයට විනයට බහා බැලීම

එතකොට දෙවැනි කරුණ බුදුහාමුදුරුවෝ දේශනා කරනවා. මේක දීර්ඝ ලෙස දේශනා කරනවා උන්වහන්සේ මහා "පරිනිබ්බාන සූත්‍රයේ" මහා පරිනිබ්බාන සුත්‍රය කියන්නේ දිගම සුත්‍රයක් නේ ඒකෙ "සසර මහා පදෙස" කියලා කොටසක් වෙනම දේශනා කරනවා ඔය ධර්ම ගැටළු ලිහා ගන්න එතකොට උන්වහන්සේ එකේ පෙන්වනවා.

මේ සස්නේ මහණ මෙසේ කියනවා.

1. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මා හට මෙසේ දේශනා කර ඇත.
2. අසවල් ආවාසයෙහි ස්ථවිර භික්ෂුන් හා සංඝයා වෙසෙති. ඒ සතුන් විසින් මා හට මෙසේ දේශනා කර ඇත.
3. අසවල් ආවාසයෙහි වෙසෙන විනයධර, මාතෘකාධර තෙරුන් විසින් මා හට මෙසේ දේශනා කර ඇත.
4. අසවල් ආවාසයෙහි මාතෘකාධර, විනයධර එක් තෙරනමක විසින් මා හට මෙසේ දේශනා කර ඇත.

ඒ හතර ආකාරයෙන් ඒකටයි කරුණු හතරක් කියලා කිව්වේ. කරන්න තියෙන්නේ එකම දෙයයි. මොකක්ද? ඒ ඇවිල්ලා. කියපුවාම ඒක, එක පාරට පිළිගන්නත් බැහැ එක පාරට බැහැර කරන්නත් හොඳ නැහැ. එහෙනම් මොකක්ද කරන්න ඕන? ධර්මයට, විනයට බහා බලන්න කියලා කිව්වා. දැන් ඕක බොහොම පරිස්සමෙන් ලිහා ගන්න ඕන තැනක්. ධර්මය කිව්වේ මොකක්ද? විනය කිව්වේ මොකක්ද? ධර්මයට, විනයට බහා බලන්න කියන එක එහෙනම් හැමදෘම ගලපා බලන්න පුළුවන් කරුණක් මේ. එතකොට බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වුණ ආසන්න කාලයේදී වුණත් යොදන්න පුළුවන් ධර්මතාවයක් ගැනයි මේ කියන්නෙ.

## ධර්මය යනු කුමක්ද?

එහෙනම් මොකක්ද ධර්මය කියන්නේ? මොකක්ද විනය කියන්නේ? කියලා දැන ගන්න ධර්මය කියලා කියන්නේ. (අපි ඒක තව දුරටත් විස්තර කරගන්නවා හතර වෙනි කරුණ කථා කරන කොට) මේ පටිච්චසමුප්පාද ධර්ම, දැන් ඒක හොදට පැහැදිලියි "වක්කලි සුත්‍රයෙන්" බුදුහාමුදුරුවෝ වක්කලි හාමුදුරුවන්ට කියපු කථාවෙන් බුදුහාමුදුරුවෝ වක්කලී හාමුදුරුවන්ව බැහැ දකින්න වැඩියා වක්කලී හාමුදුරුවෝ බොහොම අසනීපෙන් මරණාස්සන්නව ඉන්න අවස්ථාවේ බුදුපියාණන් වහන්සේ වඩින කොට, වක්කලී හාමුදුරුවෝ නැගිටින්න හදනවා ඉතින් බොහාම දුර්වල වී නැගිටින්න බැහැ.

බුදුහාමුදුරුවෝ කියනවා නැගිටින්න ඕන නැහැ වක්කලී මේ ආසන තියෙන්නේ මම ඉදගෙන කථා කරන්නම් කියලා.

ඊට පස්සේ වක්කලී හාමුදුරුවෝ කියනවා. මම මේ අසනීපෙන් නිසා ඔබ වහන්සේට බැහැ දකින්නත් එන්න බැරි වුණා හුඟ කාලෙකින්

බුදුහාමුදුරුවෝ කියනවා මේ කය බලන්නේ මොකටද වක්කලී ? ඔබේ කයේ තියෙන දෙතිස් කුණපයම් තමයි මේ කයෙත් තියෙන්නේ මේ ශරීරය දැක්කයි කියලා කිසිම සෙතක් වෙන්නේ නැහැ. බුදුන් දකින්න ඕන නම් යම්කිසි කෙනෙකුට මේ කුණු කය දිහා බැලුවට වැඩක් වෙන්නේ නැහැ.

"වක්කලී, ධර්මය දැක්ක කෙනා තමයි බුදුන් දකින්නේ ඒක මේ ඇහෙන් දකින්න පුළුවන්, මස් ලේ කයත් බලලා කරගන්න පුළුවන් එකක් නෙවෙයි. ඒ හින්ද මේ කුණු කය නෙවෙයි බලන්න ඕන ධර්මය බලන්න ඒ ධර්මය මොකක්ද? කියලා දැනගන්න ඕන නම් පටිච්චසමුප්පාදයයි බලන්න ඕන අන්න ඒක තමයි ධර්මය කියන්නේ" කියලා පැහැදිලිවම බුදුපියණන් වහන්සේ විස්තර කරනවා ඔන්න ඕකයි අපි ධර්මය කියලා බහා බැලිය යුත්තේ ඔන්න ඔය ධර්මයට බහා බලන්න ඕන ඔය ධර්මය මොකක්ද කියලා ඒ හින්ද අපි තේරුම් ගන්න ඕන බුදුහාමුදුරුවෝ පටිච්චසමුප්පාද කිව්වේ මොකටද ඒකම තමයි ධර්මය කියන්නේ ඒ බුදුහාමුදුරුවෝ දේශනා කරපු පටිච්චසමුප්පාද ටිකම තමයි මුළු ධර්මස්කන්ධයේම තියෙන්නේ. අඩු වැඩි වශයෙන් එක එක ආකාරෙයෙන් උන්වහන්සේ විග්‍රහ කර කර, විග්‍රහ කර කර පෙන්නුවා.

එතකොට ඒ පටිච්චසමුප්පාදය කොයි තරම් ගැඹුරුද කියලා අපි තේරුම් ගන්නවා නම් ආනන්ද හාමුදුරුවෝ අහනවා. ආනන්ද හාමුදුරුවෝ කියන්නේ ධර්ම භාණ්ඩාගාරිකනේ. උන්වහන්සේ තරම් මේ බුදුපියාණන් වහන්සේගේ සුත්‍ර අහපු මතක තියාගත්ත තේරුම් ගත්ත කෙනෙක් නැහැ. වැඩිම සුත්‍ර ගණනක් අහලා තියෙන්නේ උන්වහන්සේ එතකොට ඒ ධර්මභාණ්ඩගාරිකයන් වහන්සේ ඇවිල්ලා බුදුපියාණන් වහන්සේට කියනවා "බුදුපියාණන් වහන්ස. මේ පටිච්චසමුප්පාදය කියන්නේ මහා ගාම්භීර දර්ශන ඉගැන්වීමක් මේක දැන් නම් මට වැටහෙනවා" කියලා එතකොට බුදුහාමුදුරුවෝ කියනවා "මා හිවං ආනන්ද කියලා" එහෙම කියන්න එපා ආනන්ද. ඒක නොකිව යුතු වචනයක්. අවචනයක්" වචනයක් නෙමෙයි කියන්න හොද නැහැ එහෙම ඒ තරම් ගැඹුරුයි මේක මේකේ සිමාවක් නැහැ බුද්ධ ඥාණයෙන් තමයි හරියට දැක ගන්න පුළුවන් වෙන්නේ එයින් මෙපිට කිසි කෙනෙකුට මේකෙ සමස්ථය වැටහෙන්නේ නැහැ.

ඒ සමස්ථය දැක ගන්න ඕන නැහැ නිවන් දකින්න. ඒ මුල ධර්මයයි තේරුම් ගන්න ඕන බුදුපියාණන් වහන්සේ ඕක විග්‍රහ කරලා තියෙනවා අනන්ත අප්‍රමාණ ක්‍රම වලින් ඒ චලන කරපු එකෙක් මුල ධර්ම වශයෙන් විග්‍රහ කරපු ක්‍රම රටවල්, දැන් අපි පිටකයන් බැලුවොත් එහෙම 96 ආකාරයකට බුදුපියාණන් වහන්සේ ඕක චලන කරනවා දැන් මේ 96 කවද බලාගන්නද කියලා හිතන්න දෙයක් නැහැ. එහෙම ඔක්කෝම දැනගන්න ඕනෙයි කියලා බුදුහාමුදුරුවෝ කිසිම තැනක කියලා නැහැ. මේකේ මූලික හරය තමයි අපි වටහා ගන්න ඕනෑ.


